

## මගේ ලෝකය

# සුදාරගේ වේදිකා පෙළහර



ජගත් ජේ එදිරිසිංහ

දරුවන් මල්වැනි යයි කියන්නට අපි කැමැතිවන්නේ ඔවුන් අපේ ලෝකය වර්ණවත් කරන නිසා ය. ඒ දරුවන් අතරින් අතළොස්සක් වූ දරුවෝ සිය දස්කම් වලින් අපේ ලෝකය සුවඳින් පුරවයි. ඒ විරළ දරු පරපුර දෙස බලා සිටීම පවා සතුටකි. ආශ්වාදයකි.

කලාතුරකින් දකින්නට ලැබෙන අපූරු දස්කම් දක්වන දරුවකු වේදිකාවක් මත දැක ගන්නට පෙබරවාරි 15 වන සෙනසුරාදා ග්ලැඩ්ස්ටන් පාක්හිදී අපට වාසනාව
ලැබුණි. ඒ සිය විස්මිත දස්කම් වලින් වේදිකාව පුරවා ලූ සුදාර සිල්වා දරුවා ය.

සුදාර ගැන නොදන්නා අයකු මෙල්බන් ශ්‍රී ලාංකික සමාජයේ සිටින්නේ යයි අපි නොසිතමු. ජන ගී ගායනයෙන් නර්තනයෙන් ඔහු පසුගිය කාලය තිස්සේ දැක්වූ දස්කම් ගැන අපි නොයෙක් වර කතා කර ඇත්තෙමු. ඒ අපූරු හැකියාව ඔහු වඩ වඩාත් ඔප්නංවාගෙන ඇති ආකාරය
පෙන්වන සුදාරගේ සිහල ගී ප්‍රසංගය බොහෝ කාලයකට අමතක නොවන ප්‍රසංගයක් බව අවිවාදිත ය.

සුදාර සිය වේදිකා නිර්මාණ ඉදිරිපත්කිරීමේ විලාශය සිත්ගන්නා සුළුය. ඔහුගේ සැහැල්ලූ වේදිකා පරිශීලනය මෙහිදී කැපී පෙනෙයි. ඒ සැහැල්ලූ බව වැඩිහිටියකුට වුව ද ආදර්ශයට ගත හැකි තරම් පරිණත ය. වේදිකාවේ සමස්ථ වපසරියම ඔහු තම ආධිපත්‍යයට නතුකරගන්නේ දැඩි ආත්ම විශ්වාසයකින් බව පැහැදිළි ය.

ඉදරිපත්කිරීමේ විලාසයෙන් පමණ-ක් නොව ගායන කුසලතාවෙන්ද ඔහු බොහෝ ඉදිරියට ගොස් ඇති ආකාරය සුදාරගේ සිහල ගී ප්‍රසංගය අපට පෙන්වා දෙයි. ප්‍රවේශපත් හමාර වූ බැවින් බොහෝ දෙනෙකුට නරඹන්නට නොහැකි වූ මේ ප්‍රසංගය සුදාරගේ නිර්මාණ කුසලාවේ විශිෂ්ටත්වය නැවත වතාවක් මෙල්බන් පුරවරයේ ශ්‍රී ලාංකිකයනට පෙන්වා දුනි.

ප්‍රසංගයේ මුල භාගයේ සුදාර සහ සියෝද්‍රා ජයවර්ධන දැරිය එක්ව ප්‍රසංගය නරඹන්නන්වෙත ගෙන ආ ආකාරය ඉතා පැසසුම් කටයුතුය. කුඩා කල සිටම වේදිකාව හුරු සියෝද්‍රා සිය සුපුරුදු හැකියාව මෙහිදී අපට පෙන්වා දුන්නා ය. මෙවන් දරු දැරියන් රැසක් මේ ප්‍රසංගයට එක්කරගැනීමෙන් ඔවුන-ටද සිය දක්ෂතා මුවහත් කරගන්න-ටත් සමාජයට ඉදිරිපත් කරන්නටත් අවස්ථාව සළසාදී තිබීම ඉතා වැදගත් ය.

සුදාර ගොඩ නැගෙන්නේ ඔහුගේ පියා වන නන්දසිරි ද සිල්වා ගේ ගුරුහරුකම් මැද වීම ඔහුට විශාල වාසියකි. ප්‍රවීණ කලාකරුවකු ලෙස නන්දසිරි ද සිල්වා සතු හැකියාව සහ දැනුම සිය බාල පුතනුවන්ටද ලබා-දෙන්නට ඔහුට හැකිවීම භාග්‍යයකි.

ප්‍රසංගයේ වේදිකා පසුතල සැකැස්ම විශේෂයනේ කැපී පෙනෙයි. සියලූම අංග සඳහා එකිනෙකට වෙනස් පසුතල නිර්මාණ සකස් කරන්නට දරා ඇකි වෙහෙස සුලූපටු නෙවේ. ප්‍රසංගයේ සිත්කළූ බව වැඩි කරන්නට මේ පසුතළ නිර්මාණ කළ
මෙහෙය අපමණ ය.

සුදාරගේ සොහොයුරා උදාරත් සොයුරිය උදාරිත් ප්‍රසංගයේ සාර්ථකත්වයට කළ මෙහෙය විශාල ය. උදාර වාදනයෙන් සහ නර්තනයෙනුත් උදාරි නර්තනයෙනුත් ප්‍රසංගය වර්ණවත් කළ හ.
නර්තනාංග සඳහා එක්ව සිටි අනෙක් දැරියන්ද දරුවන්ද අපේ සමාජය දක්ෂ දරුවන්ගෙන් පොහොසත් බව පෙන්වා දුන් හ. චින්තක සිරිකුමාරගේ කුඩා පුතනුවන් වන තරීන් දිනාල් ගේ රංගනය ගැනද සඳහන් කළ යුතුම ය.

වැඩිහිටියන් ලෙස රංගනයටත් ගායනයටත් එක් වූ චින්තක සිරිකුමාර, බිමල් ප්‍රනාන්දු ඇතුළු පිරිස ගේ දායකත්වට ප්‍රසංගයේ අගය ඉහළ දමන්නට බෙහෙවින් පිටුවහල් විය. ඔවුනගේ හැකියාව සුදාරගේ ප්‍රසංගයේ වෙනුවෙන් යොදා ගැනීම ඉතාම බුද්ධිමත් පියවරකි. දරුවන්ගේ වේදිකා මත සිය පුද්ගලික කෝන්තර පිරිමහ-න්නට තැත්කරන මුග්ධ මිනිසුන් සිටින සමාජයක මේ හොඳ වැඩිහිටියන්ගේ යහපත් දායකත්වය වඩාත් කැපී පෙනෙයි.

සමස්ථයක් ලෙස ගත්විට සුදාරගේ සිහල ගී ප්‍රසංගය මෙල්බන් වේදිකා ප්‍රසංග ඉතිහාසයේ වැදගත් තැනක් හිමිකරගත් බව ලියා ගැබිය යුතුම ය. සුදාරගේ තවත් දක්ෂතා ඉදිරියේදීත් දකින්නට අපට  වාසනාව ලැබේවායි පතමු.


